ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

සන්නිවේදන දෙපාර්තමේන්තුව
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| | |
|---|---|
| නිකුත් කළේ | සංඛ්‍යාන දෙපාර්තමේන්තුව |
| දිනය | 2014/08/29 |

## 2014 අගෝස්තු මාසයේ දී උද්ධමනය පහළ වැටේ.

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ගණනය කරනු ලබන කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකයේ (කො.පා.මි.ද.) (2006/07=100) විචලනය මගින් මනිනු ලබන උද්ධමනය, වාර්ෂික සාමාන්‍ය පදනම මත, 2013 ජූනි මාසයේ සිට පෙන්නුම් කළ පහළ බැසීමේ උපනතිය අඛණ්ඩව පවත්වා ගනිමින්, 2014 ජූලි මස වාර්තා කළ සියයට 4.7 ට සාපේක්ෂව 2014 අගෝස්තු මාසයේ දී සියයට 4.5 දක්වා ළඟා විය. ලක්ෂ්‍යමය පදනම මත උද්ධමනය ද ආහාර අයිතමයන්ගේ, විශේෂයෙන්ම එළවළු මිල ගණන් පහළ යාම හේතුවෙන් පූර්ව මාසයේ පැවති සියයට 3.6 හි සිට 2014 අගෝස්තු මාසයේ දී සියයට 3.5 දක්වා පහළ වැටිණි.



2014 අගෝස්තු මාසයේ දී කො.පා.මි.දර්ශකයේ සියයට 0.5 ක් වූ මාසික පහළ යාම සඳහා ආහාර හා මධ්‍යසාර නොවන පාන වර්ග අයත් උප කාණ්ඩයේ අයිතමයන්ගේ මිල ගණන් පහළ යාම ප්‍රධාන දායකත්වය සැපයීය. ආහාර කාණ්ඩය තුළ, සියලුම වර්ගවල පාහේ එළවළු, අමුමිරිස්, අර්තාපල්, රතුළූණු සහ සමහර මත්ස්‍ය වර්ගවල සාමාන්‍ය මිල ගණන් ඍතුමය සාධක හේතුවෙන් පූර්ව මාසයට සාපේක්ෂව පහළ ගියේය. මේ අතර, සහල්, පළතුරු සහ බිත්තර මිල ගණන් මෙම මාසය තුළ ඉහළ ගියේය.

ආහාර නොවන කාණ්ඩයේ, රෙදිපිළි හා පාවහන්; සන්නිවේදන; විනෝදාත්මක හා සංස්කෘතික; සහ විවිධ භාණ්ඩ හා සේවා යන උප කාණ්ඩයන්හි අයිතමයන්ගේ මිල ගණන් ඉහළ ගියේය. නිවාස, ජලය, විදුලිය, ගෑස් සහ අනෙකුත් ඉන්ධන; ගෘහ භාණ්ඩ, ගෘහ උපකරණ හා දෛනික ගෘහ නඩත්තුව; සෞඛ්‍ය; ප්‍රවාහන; සහ අධ්‍යාපන යන අනෙකුත් උප කාණ්ඩ සියල්ලන්ගේම මිල ගණන් පූර්ව මාසයට සාපේක්ෂව බොහෝ දුරට නොවෙනස්ව පැවතිණි.

ආර්ථිකයේ යටිදැරි උද්ධමනය පෙන්නුම් කරන මූලික උද්ධමනය, 2014 අගෝස්තු මාසයේ දී පූර්ව මාසයට සාපේක්ෂව සුළු වශයෙන් ඉහළ ගියේය. ඒ අනුව, මූලික උද්ධමනය ලක්ෂ්‍යමය සහ වාර්ෂික සාමාන්‍ය පදනම මත පිළිවෙළින්, 2014 ජූලි මස පැවති සියයට 3.7 සහ සියයට 3.1 හි සිට 2014 අගෝස්තු මාසයේ දී පිළිවෙළින්, සියයට 3.9 සහ සියයට 3.2 දක්වා ඉහළ නැගිණි.

–